(සිංහල නිවේදනය පහතින් ඇත)

2016 October 17

**DecentLanka2015**
**ශිෂ්ටලංකා2015**
decentlanka2015@gmail.com

**<u>Media Release</u>**



**Policy and legal framework of the proposed Counter Terrorism Act of Sri Lanka – Stop enacting laws violating democratic and fundamental rights**

The draft titled "Policy and legal framework of the proposed Counter Terrorism Act of Sri Lanka" is meant to replace the much criticised and denounced Prevention of Terrorism Act (ACT) that infringes on basic human rights of the people. It is now reported this new draft for "counter terrorism" has been referred by the Cabinet to two Sectoral Oversight Committees on National Security and Justice. Very authoritative sources have read it as far more terrifying than even the PTA it would replace.

With this draft "Counter Terrorism Act", Sirisena-Wickramasinghe coalition government seems to be unduly using the opportunity provided by the UN OISL Resolution 30/1 co-sponsored with the US in 2015 October. The new piece of law if adopted could give them occasion to crush any dissent, any opposition, labelling all as "terrorism".

The proposed "Counter Terrorism Act" is quoted as leaving intentional ambiguity in defining "terrorism" with unnecessary and unbelievable "offences" also introduced to its draft. If allowed passage through parliament, questioning government policy on any issue could be defined as an "act of terrorism", if the government so desire. To call for a change of government, except during an election could also be interpreted as an "act of terrorism". The draft can even define discussions on ideology as "acts of terrorism", terming them as “any act of violent extremism towards achieving ideological domination”. This particular phrase can even be extended to include articles and programmes in media that critique government policy and propose alternatives.

Vague language and phrasing like "illegally or unlawfully compelling the Sri Lankan Government (or that of any other sovereign nation) to reverse, vary or change a policy decision…" and also “any act of violent extremism" can be interpreted at will by authorities and is extremely dangerous for democracy. So will "ideological domination” remain to be interpreted. The whole draft thus allows the government in power to crush any dissent or opposition that may challenge it, a fundamental and a democratic right of the Citizenry.

The draft in question also includes provision to deny the right of a "suspect" to have access to an attorney at law for 48 hours from the time of arrest and before the first statement is recorded. It was this same provision that compelled the government to withdraw its proposed amendments to the Code of Criminal Procedure (CCP) Act, a week ago.

Most provisions clearly contradict Chapter III, Constitution 14 of the present Constitution that guarantee "freedom of expression" as a fundamental right. All of it taken in the context of President Sirisena's assumption of selective justice declared publicly (controversial statement made at SLFI on 12 Oct.) makes a mockery of law enforcement, where democracy and rule of law would fall victim to dictatorial diktats of those abusing power.

We therefore stand firmly convinced, this piece of draft law is far worse than the PTA it is meant to replace. The proposed draft should not be gazetted and brought to parliament as it stands. We demand it be dropped forthwith completely and a new piece of law be drafted to replace the PTA. And that draft to be opened for public consultations before it goes through the legal process of becoming law.

**Signatories -**

Neville Ananda Attorney at law
Muditha Karunamuni Social activist
Kusal Perera Journalist
Anton Marcus Trade union leader
Dr. Indi Akurugoda Academic, University of Ruhuna
Amrit Muttukumaru Public Interest activist
Srinath Perera Attorney at law
Hasantha Gunaweera, Agriculture consultant & Community Development activist

**Contacts –**
Attorney at law Neville Ananda - 0777876811

2016 ඔක්තෝම්බර 17 වන දින

<u>**මාධ්‍ය නිවේදනය**</u>

**ශ්‍රී ලංකා ත්‍රස්තවාදය මැඬලීමේ යෝජිත පනත සඳහා ප්‍රති පත්ති සහ නීතිමය රාමුව - මූලික මිනිස් අයිතීන් හා ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කෙරෙන නීති පැනවීම අත්හිට වනු**

''ශ්‍රී ලංකා ත්‍රස්තවාදය මැඬලීමේ යෝජිත පනත සඳහා ප්‍රතිපත්ති සහ නීතිමය රාමුව'' මැයෙන් වන කෙටුම්පත මගින් උත්සාහ කෙරෙන්නේ ජනතාවගේ මූලික අයිතීන් උල්ලංඝණය කෙරෙන දරුණු පනතක් ලෙස නම් කෙරෙන ''ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත'' සඳහා ආදේශකයක් ගෙන ඒමටය. මෙම ත්‍රස්තවාදය මැඬලීමේ පනත් කෙටුම්පත මේ වන විට ජාතික ආරක්ෂාව සහ අධිකරණ ආංශික අධීක්ෂණ කාරක සභා වෙත අමාත්‍ය මණ්ඩලය විසින් යොමුකර ඇතැයි වාර්තා වන්නේය. ඒ සම්බන්ධ මෙතෙක්වන ප්‍රවීණ විචාර අනුව, මෙම පනත පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටද වඩා භයානකය.

පසුගිය 2015 ඔක්තෝමබරයේ ඇමෙරිකාව සමග හවුලේ සම්මත කරගත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම් යෝජනාව (30/1) විසින් ලබාදී ඇති අවකාශය සිරිසේන-වික්‍රමසිංහ ආණ්ඩුව අයුතු ලෙස යොදා ගන්නා සෙයකි. මෙම කෙටුම්පත නීතිගත වුවහොත් ඔවුන්ට සියලු විරෝධ, සියලු විසම්මුති ''ත්‍රස්තවාදය'' යැයි නම්කර මර්දනය කිරීමේ නීතිමය අයිතියක් ලැබෙන්නේය.

''ත්‍රස්තවාදය'' අර්ථකතනය කිරීමේදී හිතාමතා අවුල් අවිනිශ්චිත භාෂාවක් යොදා ඇතැයිද විශ්වාස කළ නොහැකි අනවශ්‍ය ''වරදවල්'' කෙටුම්පතට ඇතුලුකර ඇතැයිද වාර්තා විය. මෙය පාර්ලිමේන්තුවෙන් සම්මත කෙරුණහොත් ඕනෑම කාරණාවක් සම්බන්ධ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රශ්න කිරීමත් ආණ්ඩුවේ අභිමතය අනුව ''ත්‍රස්තවාදී ක්‍රියාවක්'' ලෙස නම් කළ හැකිය. මැතිවරණ අතරතුර ආණ්ඩුව ඉවත් විය යුතුයැයි කීමද එළෙසින්ම ''ත්‍රස්තවාදී ක්‍රියාවක්'' ලෙස නම් කළ හැක්කකි. එම කෙටුම්පතට අනුව, මතවාදී සාකච්ඡා පවා ''මතවාදී ආධිපත්‍යයක් සඳහා වන ප්‍රචණ්ඩ අන්තවාදී ක්‍රියා'' ලෙස නම් කළ හැකිය. එවිට එයද ''ත්‍රස්තවාදී ක්‍රියාවකි''. විශේෂයෙන් මෙම වාක්‍ය ඛණ්ඩය බලධාරීන්ට අවශ්‍ය නම්, ආණ්ඩුවේ ප්‍රතිපත්ති සංවාදයට තබමින් විකල්ප යෝජනා ඉදිරිපත් කෙරෙන මාධ්‍ය වැඩසටහන් හා ලිපි සඳහාද අදාල කරගත හැකිය.

''නීති විරෝධීව හෝ අවනීතිමය ආකාරයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ (හෝ වෙනත් ස්වෛරී රාජ්‍යයක) ප්‍රතිපත්ති වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට....'' වාගේම, ''ඕනෑම ප්‍රචණ්ඩ අන්තවාදී ක්‍රියාවක්'' යනුවෙන් අවිනිශ්චිත අර්ථ සහිත භාෂාවක් යොදා ගැනීම අතිශය භයානක මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට බලවත් තර්ජනයකි. ''මතවාදී ආධිපත්‍යය'' යන්නත් එළෙසින්ම අර්ථකතන සඳහා ඉතිරි වන්නකි. ඒ අනුව, ආණ්ඩුවට අභියෝග කරන්නට පුරවැසියන්ට ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ඇතත් එසේ අභියෝග කරන්නාවූ විසම්මුතිවාදීන් හා සියලු ප්‍රතිවාදීන් මර්දනය කිරීමට ආණ්ඩුව මෙයින් ඉඩ ලබා ගනු ඇත.

එවගේම මෙම පනතින් අත්අඩංගුවට ගනු ලැබූ සැකකාර පුද්ගලයෙකුට නීතිඥ සහාය ලබා ගැනීමේ මූලික අයිතිය පළමු සාක්ෂි සටහන ලබා ගන්නා තුරු හෝ පළමු පැය 48 ඇතුළත අහෝසි කර ඇත. අපරාධ නීතියට ඉදිරිපත් කළ සංශෝධන සහිත පනත ඉවත් කර ගැනීමට ආණ්ඩුවට සිදුවූයේ විශේෂයෙන් එහි වූ මෙම ප්‍රතිපාදනයට එරෙහිව ගොනු වූ විරෝධය හමුවේය.

මෙහි අඩංගු බොහෝ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තෙවන පරිච්ඡේදයේ 14 වන ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති ''අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය'' විශේෂයෙන් උල්ලංඝණය කරති. මේ සියල්ල ජනාධිපති සාධාරණත්වය සඳහා ඉදිරිපත් කළ සුවිශේෂි තේරීම් (ඔහුගේ ඔක් 12 වන දින කෙරුනු මතභේදාත්මක ප්‍රකාශය) සමග ගත් විට, මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම මගඩියක් වනු ඇත. නීතිය හා සාමය පවත්වා ගැනීමත් ප්‍රජාතන්ත්‍රවාදයත් බලය අයුතු ලෙස යොදා ගන්නවුන්ගේ හිතුවක්කාර නියෝග හමුවේ විපතට පත්විය හැකි බැවිනි.

ඒ නිසාම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා ආදේශකයක් ලෙස ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටද වඩා භයානක යැයි අපි තරයේ විශ්වාස කරමු. එනිසාම එය ගැසට් නොකළ යුතු යැයි හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ යුතු යැයි අපි කියමු. එය මුලුමනින් අත්හල යුතුය. ඒ වෙනුවට නව කෙටුම්පතක් සියල්ලට පෙර මහජනතාව හමුවේ තබන මෙන් අපි මෙයින් ඉල්ලා සිටිමු.

**අත්සන් කළේ -**
නීතිඥ නෙවිල් ආනන්ද
සමාජ ක්‍රියාධර මුදිත කරුණාමුනි
මාධ්‍යවේදී කුසල් පෙරේරා
වෘත්තීය සමිති නායක ඇන්ටන් මාකස්
රුහුණු විශ්ව විද්‍යාලයය, ආචාර්ය ඉන්දි අකුරුගොඩ
සිවිල් අයිතිවාසිකම් ක්‍රියාධර අම්රිත් මුතුකුමාරු
නීතිඥ ශ්‍රීනාත් පෙරේරා
කෘෂි උපදේශක හා සමාජ සංවර්ධන ක්‍රියාධර හසන්ත ගුණවීර

**සම්බන්ධීකරණය -**
නීතිඥ නෙවිල් ආනන්ද - 0777876811